**සී/ස මාන්තායි සෝල්ට් සමාගම - 2017/2018**
**-----------------------------------------------**

සී/ස මාන්තායි සෝල්ට් සමාගමේ ("සමාගම") 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරිමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
**--------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**
**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**------------------------------------------**

2018 මාර්තු 31 දිනට රු. 7,012,838 වටිනා මෙට්‍රික් ටොන් 1,243.4 ලුණු තොග ඌනතාවයක් නිරීක්ෂණය විය. කෙසේවෙතත්, මෙම තොග ඌනතාවය සම්බන්ධයෙන් විමර්ශනය කර මූල්‍ය ප්‍රකාශනවල එම ඌනතාවය ගැලපීම සඳහා සමාගම විසින් කටයුතු කර නොතිබුණි.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ පැහැදිලි කරන ලද කරුණුවලින් වන බලපෑම හැර , සී ස මාන්තායි සෝල්ට් සමාගමේ/2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

2.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2007 අංක 7 දරන සමාගම් පනතේ 163(2) වගන්තියේ නියමය පරිදි, පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණනයේ සීමා කිරීම් ඉහත පරිදි දක්වනු ලැබේ.

(ආ) මාගේ මතය වනුයේ,

- තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි ගිණුම්කරණ වාර්තා සමාගම පවත්වාගෙන ගොස් ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල බවත්ය.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ ලාභය රු.27,789,256 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු. 33,516,078 ක් වූයෙන්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,726,822 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආදායම රු. 10,077,542 කින් අඩුවීම, පරිපාලන වියදම් රු. 4,236,220 කින් වැඩිවීම සහ වෙනත් ආදායම් රු.7,242,292 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3.2 විශ්ලේෂණාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාගමේ දළ ලාභ අනුපාතය සහ ශුද්ධ ලාභ අනුපාතය පිළිවෙළින් සියයට 3.67 කින් සහ සියයට 2.54 කින් පහළ ගොස් තිබුණි. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂය සඳහා විකුණුම් පිරිවැය සියයට 3.58 කින් වැඩිවීම සහ පරිපාලන වියදම් සහ බෙදාහැරීමේ වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ තොගය අධික ලෙස ඉහළ යාම හේතුවෙන් ජංගම අනුපාතය සියයට 0.69 කින් ඉහළ ගොස් තිබූ අතර ක්ෂණික වත්කම් අනුපාතය සියයට 0.13 කින් පමණක් ඉහළ ගොස් තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

සමාලෝචිත වර්ෂය සඳහා සමාගමට විධායක අධ්‍යක්ෂවරයෙකු පත්කර තිබුණද, සමාගමේ කටයුතුවලට ඔහු සම්බන්ධ වී නොතිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා මාසික වැටුප් සහ ඉන්ධන දීමනා ඇතුළු එකතුව රු.951,000ක මුදලක් සමාගම විසින් ගෙවා තිබුණි.

4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

2017 අප්‍රේල් මස සිට 2018 මාර්තු මස දක්වා සේවයේ යෙදුණු දෛනික වැටුප් ලබන සේවකයකු සඳහා දෛනික පැමිණීමේ ලේඛනයක් පවත්වාගැනීමෙන් තොරව රු. 9,309,222ක මුදලක් ගෙවා තිබුණි.

4.3 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

ගිවිසුම අනුව ලුණු නිකුත් කිරීම සඳහා දී තිබුණු කාලය දින 60ක් පමණක් වුවද, එකතුව රු.21,159,500 ක් වූ විකුණුම් වටිනාකමකින් යුත් දෙවැනි තත්ත්වයේ ලුණු මෙට්‍රික් ටොන් 2,115.95 ක් මාස 3 සිට වර්ෂයක අධික කාලයක සිට එලිෆන්ට්පාස් ලුණු ලේවායන්වලින් නිකුත් කර නොතිබුණි.

4.4 වත්කම් කළමනාකරණය

එලිෆන්ට්පාස් ලුණු ලේවායන් විසින් ස්ථාවර වත්කම් ලේඛනය සහ ඉන්වෙන්ට්‍රි ලේඛනය විධිමත්ව පවත්වා නොතිබුණි.